*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I** **කාලය පැය 1 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

උපදෙස්:
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 - 40 තෙක් ප්‍රශ්නවලට **(1) (2) (3) (4)** පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

---

- **පහත සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 1 - 3 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

කාර්මික විද්‍යාලයේ වාහන අළුත්වැඩියා කිරීම පිළිබඳ පාඨමාලාවක් හැදෑරූ රුවන් තම ප්‍රදේශයේ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් ආරම්භ කරන ලදී. පාරිභෝගිකයන්ට තම යතුරු පැදිය අළුත්වැඩියා කර ගැනීමට එම ප්‍රදේශයේ එවැනි වැඩපලක් නොතිබුණි.

01. මෙම සිද්ධියේ සඳහන් රුවන්ගේ ව්‍යාපාරය,
(1) හවුල් ව්‍යාපාරයකි (2) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි
(3) ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි (4) සේවා සපයන ව්‍යාපාරයකි

02. මෙම ව්‍යාපාරයෙන් ඉටුකරනු ලබන අවශ්‍යතාව වන්නේ,
(1) අධ්‍යාපනය (2) ආරක්ෂාව (3) ප්‍රවාහනය (4) සෞඛ්‍යය

03. රුවන්ගේ ව්‍යාපාරයට ඇති අවස්ථාවක් වන්නේ,
(1) කාර්මික විද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරීම
(2) ප්‍රදේශය තුළ යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් නොතිබීම.
(3) ඔහු සතු හොඳ මූල්‍ය ශක්තියක් තිබීම.
(4) මෝටර් රථ අළුත්වැඩියාව පිළිබඳ දක්ෂයකු වීම.

04. පරිසරයට හිතකාමී ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ දැයි සොයා බැලීම ප්‍රධාන අරමුණක් වන්නේ,
(1) ප්‍රජාවගේය. (2) රජයේය (3) අයිතිකරුවන්ගේය (4) ගනුදෙනුකරුවන්ගේය

05. ගැමුණු විසින් කාන්තා ඇඳුම් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරගෙන යයි. ඔහු තම ව්‍යාපාරය නෛතික පුද්ගලභාවයක් සහිතව පුළුල් කිරීමට අපේක්ෂා කරයි. මේ සඳහා ඔහුට වඩාත්ම සුදුසු සංවිධානය වන්නේ,
(1) හවුල් ව්‍යාපාරයකි (2) සංස්ථාපිත සමාගමකි
(3) තනිපුද්ගල ව්‍යාපාරයකි (4) රාජ්‍ය දෙපාර්තමේන්තු

06. ඇතැම් ව්‍යාපාර සඳහා වාහන මිලදී ගැනීමක් හෝ බැංකු ණයක් ලබා ගැනීමේ දී ව්‍යාපාර නාමයෙන් නොව තමාගේ පෞද්ගලික නමින් කළ යුතු වේ. එවැනි ව්‍යාපාරයක් වන්නේ,
(1) සංස්ථාපිත සමාගමය (2) සමුපකාර සමිතිය (3) රාජ්‍ය සංස්ථාය (4) තනි පුද්ගල ව්‍යාපාරය

07. ජාත්‍යන්තර වශයෙන් භාවිත වන ප්‍රධාන ණයපත් ජාලයක් නොවන්නේ,
(1) මාස්ටර් (2) ඩිස්කවර් (3) සෙට් (4) වීසා

08. කිසියම් විදේශීය රටකට හෝ රටවල් කීපයකට දේශීය නිෂ්පාදිත විකිණීම හඳුන්වන්නේ,
(1) ආනයන ලෙසය (2) අපනයන ලෙසය (3) විදේශීය වෙළඳාම ලෙසය (4) තොග වෙළඳාම ලෙසය

09. ලංකා බැංකුවේ ජංගම ගිණුම් හිමියකු වන සුගත්, ජානකගේ නමට රු. 150 000 ක චෙක්පතක් නිකුත් කළේය. ජානක එම චෙක්පත පිටසන් කොට විමල්ට පැවරුවේය. විමල් එම චෙක්පත මහජන බැංකුවේ ඇති තම ගිණුමේ තැන්පත් කරන ලදී. මෙම චෙක්පතේ අණලද්දා වන්නේ,
(1) සුගත්ය (2) ලංකා බැංකුවය (3) විමල්ය (4) මහජන බැංකුවය

10. චෙක්පතෙහි දක්නට ලැබෙන චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ දැක්වෙන අංක පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) බැංකු අංකය, ගිණුම් අංකය, බැංකු ශාඛා අංකය, චෙක්පත් අංකය
(2) චෙක්පත් අංකය, ගිණුම් අංකය, බැංකු අංකය, බැංකු ශාඛා අංකය
(3) චෙක්පත් අංකය, බැංකු අංකය, බැංකු ශාඛා අංකය, ගිණුම් අංකය
(4) ගිණුම් අංකය, බැංකු අංකය, බැංකු ශාඛා අංකය, චෙක්පත් අංකය

11. පූර්ණ වගකීම් සහිත රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබූ සරත් මහතාගේ මෝටර් රථය හදිසි අනතුරකට ලක්විය. එය නැවත අළුත්වැඩියා කර යථා තත්වයට පත්කිරීමට ප්‍රමාණවත් වන්දි මුදලක් ඔහුට ලැබුණි. මෙයට අදාල රක්ෂණ මූලධර්මය වන්නේ,

(1) හානි පූර්ණය (2) රක්ෂණ හිමිකම (3) උපරිම විශ්වාසයයි (4) ආදේශනයයි

12. සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධකයක් නොවන්නේ,

(1) භාණ්ඩයේ ස්වභාවය (2) බලය (3) ආරක්ෂාව (4) ධාරිතාවය

13. පළමු වන ශ්‍රේණියට සිසුන් ඇතුලත් කර ගැනීමට අයදුම්පත් ඉදිරිපත් කිරීම, ඇතුලත් කර ගැනීමේ ක්‍රියාපටිපාටිය පාසල් වල විදුහල්පතිවරුන්ට දැනුම් දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යොදාගන්නා සන්නිවේදන මාධ්‍ය වනුයේ,

(1) ලිපි (2) දුරකථනය (3) චක්‍රලේඛ (4) රැස්වීම්

14. වාණිජ දිනය සඳහා තේමාවක් තීරණය, මුදල් හා සම්පත් කමිටු වෙත වෙන්කිරීම යන කාර්යයන් දෙක අයත් වන කළමනාකරණ කාර්යයන් දෙක පිළිවෙලින් දක්වෙන්නේ,

(1) සංවිධානකරණය, පාලනය (2) සැලසුම්කරණය, සංවිධානකරණය

(3) පාලනය, මෙහෙයවීම (4) සංවිධානකරණය, සැලසුම්කරණය

15. අලෙවිකරණ මිශ්‍රය නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ,

(1) නිෂ්පාදනය, ඇසුරුම, ස්ථානය, ප්‍රවර්ධනය (2) මිල, ස්ථානය, ප්‍රවර්ධනය, ගුණත්වය

(3) නිෂ්පාදනය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය (4) ස්ථානය, මිල, ප්‍රවර්ධනය, විකුණුම් ප්‍රවර්ධනය

16. කොළඹ කොටස් වෙළඳපොළ කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනය වනුයේ,

(1) කොටස් වෙළඳපොළ (2) ශ්‍රී ලංකා මහ බැංකුව

(3) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (4) ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව

17. රෙදිපිළි අලෙවිකරණ නාරදගේ ව්‍යාපාරයේ 2016 01 01 දිනට පැවති වත්කම් කීපයක් පහත දක්වේ.

A විකිණීමට ඇති රෙදි තොගය B රෙදි බෙදාහැරීමේ ලොරි රථය

C බැංකු ජංගම ගිණුමේ ඇති ශේෂය D කාර්යාලයේ ඇති පරිගණක යන්ත්‍රය

E අත ඉතිරිව ඇති මුදල් ශේෂය

මේවා අතුරින් ජංගම නොවන වත්කම් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) A හා B (2) B හා D (3) A, C හා E (4) B, D හා E

18. 2001 01 01 දිනට අනුරගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| වත්කම් | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|
| රු. 500 000 | = | රු. 300 000 | + | 200 000 |

2016 01 02 දින රු. 20 000 ක බැංකු ණයක් ආපසු ගෙවන ලදි. එම ගණුදෙනුවෙන් පසු ගිණුම්කරණ සමීකරණයේ නිවැරදි අගයන් දක්වා ඇත්තේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 520 000 | = | 300 000 | + | 220 000 |
| (2) | 480 000 | = | 300 000 | + | 180 000 |
| (3) | 480 000 | = | 280 000 | + | 200 000 |
| (4) | 520 000 | = | 320 000 | + | 200 000 |

19. වගකීම් ගිණුමක්, වත්කම් ගිණුමක්, හිමිකම් ගිණුමක් හා වියදම් ගිණුමක් නිවැරදිව පෙළගස්වා ඇත්තේ,

(1) බැංකු ගිණුම, මුදල් ගිණුම, ගැනිලි ගිණුම, රක්ෂණ ගාස්තු ගිණුම

(2) ණයහිමි ගිණුම, ගොඩනැගිලි ගිණුම, ගැනිලි ගිණුම, රක්ෂණ ගාස්තු ගිණුම

(3) බැංකු ගිණුම, ගොඩනැගිලි ගිණුම, ගැනිලි ගිණුම, වැටුප් ගිණුම

(4) ණයගැති ගිණුම, ගොඩනැගිලි ගිණුම, කොමිස් ගිණුම, වැටුප් ගිණුම

20. පහත ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මූලික සටහන් පොත්, ජ'නල් හෝ දෛනික පොත් ලෙස හඳුන්වයි.

(2) ව්‍යාපාරයක සිදුවන සෑම ගනුදෙනුවක්ම පළමුව මූලික පොත් වල සටහන් කළ යුතුය.

(3) මූලාශ්‍ර ලේඛන උපයෝගී කරගනු ලබන්නේ ගනුදෙනු ලෙජර ගිණුම්වල සටහන් කිරීමේ දීය.

(4) වෙළඳ භාණ්ඩ ණයට ගැනීම තහවුරු කරනුයේ ගැනුම් ඉන්වොයිසිය මගිනි.

21. ලීබඩු නිපදවන ව්‍යාපාරයක හිමිකරු තම නිවසේ ප්‍රයෝජනය සඳහා විකිණීමට ඇති ලීබඩු වලින් කොටසක් ලබා ගන්නා ලදී. මෙම ගනුදෙනුව සටහන් කළ යුතු මූලික සටහන් පොත වන්නේ,

(1) මුදල් පොත (2) ගැනුම් ජ'නලය (3) විකුණුම් ජ'නලය (4) පොදු ජ'නලය

22. 2016 01 05 දින ව්‍යාපාරය රු. 20 000 ක භාණ්ඩ තොගයක් ණයට ගන්නා ලදී. 2016 01 10 දින එම ණයෙන් කොටසක් ලදහා රු. 10 000 ක චෙක්පතක් නිකුත් කරන ලදී. ඉහත ගනුදෙනුවලට අදාල මූලාශ්‍ර ලේඛණ හා මූලික සටහන් පොත් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ගැනුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, ගැනුම් ජ'නලය, බැංකු ගිණුම

(2) ගැනුම් ඉන්වොයිසිය, ජ'නල් වවුචරය, ගැනුම් ජ'නලය, බැංකු ගිණුම

(3) විකුණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, විකුණුම් ජ'නලය, මුදල් පොත

(4) ගැනුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, පොදු ජ'නලය, මුදල් පොත

23. කේසර ව්‍යාපාරයේ සුළු මුදල් භාරකරු වූ කසුන් පහත තොරතුරු ඉදිරිපත් කරයි.

★ මාසික සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 5 000 කි.

★ 2016 මැයි මාසයේ සුළු මුදලින් කල වියදම් වල එකතුව රු. 3850 කි.

★ 2016 ජූනි පළමු වැනිදා සිට අග්‍රිමය තවත් රු. 500 ක් වැඩි කර ඇත.

2016 06 01 දින අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා ප්‍රධාන මුදල් භාරකරගෙන් කසුන්ට ලැබෙන මුදල කොපමණ ද?

(1) රු. 5 500 කි (2) රු. 4 350 කි (3) රු. 3 850 කි (4) රු 500 කි

24. ව්‍යාපාරයක් දෙන ලද ණය කාල සීමාව තුල ණය බේරුම් කල හොත් ණය මුදලින් 5% ක වට්ටමක් දෙන බව ප්‍රකාශ කර ඇත. එම ව්‍යාපාරයේ රු. 10 000 ක ණයගැතියකු හා රු. 15 000 ක ණයගැතියකු නියමිත කාලය තුල ණය බේරුම් කලේ නම්, පිරිනැමීමට සිදුවන දුන් වට්ටම කොපමණ ද?

(1) රු. 2 500 (2) රු. 1 500 (3) රු. 1 250 (4) රු. 750

25. ව්‍යාපාරයක පසුගිය මාසයේ අවසානයේ බැංකු ගිණුමේ පැවති වාසිදායක ශේෂයක් රු. 35 000 කි. බැංකුව එවනු ලැබූ බැංකු විස්තරයේ ශේෂය සමඟ සමාන නොවීය. ශේෂ දෙක අතර වෙනසට පහත හේතු බලපා තිබුණි.

A - නිකුත් කළ ඉදිරිපත් නොවූ චෙක්පත රු. 7 000

B - ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරිකය රු. 2 000

C - ණයගැතියෙකු සෘජුවම බැංකුවට කල ප්‍රේෂණ රු .4 000

D - තැන්පත් කළ නිෂ්කාශණය නොවූ චෙක්පත් රු. 3 000

මේවා අතරින් බැංකු ගිණුම සංශෝධනයේ දී සැලකිල්ලට ගත යුත්තේ

(1) A හා B (2) B හා C (3) C හා D (4) B, C හා D

26. සංශෝධිත බැංකු ගිණුමේ නිවැරදි ශේෂය විය යුත්තේ,

(1) රු. 44 000කි (2) රු. 42 000කි (3) රු. 37 000කි (4) රු. 35 000 කි

27. බැංකු ප්‍රකාශයේ පැවති ශේෂය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) රු. 33 000 කි. (2) රු. 38 000කි (3) රු. 41 000 කි (4) රු. 44 000කි

28. රු. 30 000 ක බැංකු ණය ආපසු ගෙවීම මුදල් පොතේ රු. 30 000 ක් බැරටත්, බැංකු ණය ගිණුමේ රු. 3 000 ක් හරටත් සටහන් කර ඇත. මෙම වරද නිසා අවිනිශ්චිත ගිණුමේ නිර්මාණය වන්නේ,

(1) 27 000 ක හර ශේෂයකි. (2) 27 000 ක බැර ශේෂයකි.

(3) 3000 ක හර ශේෂයකි. (4) 30 000 ක බැර ශේෂයකි.

රන්තරු ක්‍රීඩාසමාජයේ 2015 01 01 දිනට සිටි සාමාජික සංඛ්‍යාව 140 කි. එදින නව සාමාජිකයන් 05 කු බඳවා ගන්නා ලදී. සාමාජිකයකුගේ මාසික සමාජික ගාස්තුව රු. 50 යි. වර්ෂය තුල සාමාජිකයන් 130 දෙනෙකු සාමාජික මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා ඇත.

29. 2015 වර්ෂය සඳහා ලැබීම හා ගෙවීම ගිණුමේ ඇතුලත් කළ යුතු සාමාජික මුදල කොපමණ ද?

(1) රු. 78000 කි. (2) රු. 81000 කි. (3) රු. 84000 කි. (4) රු. 87000 කි.

30. 2015 වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමට ඇතුලත් කළ යුතු සාමාජික මුදල කොපමණ ද?

((1) රු. 78000 කි. (2) රු. 81000 කි. (3) රු. 84000 කි. (4) රු. 87000 කි.

31. 2015 වර්ෂයට අදාල හිඟ සාමාජික මුදල කොපමණ ද?

(1) රු. 3000 කි. (2) රු. 6000 කි. (3) රු. 9000 කි. (4) රු. 12000 කි.

32. ව්‍යාපාරයක භාණ්ඩ බෙදාහැරීම සඳහා 2015 01 01 දින මෝටර් රථයක් මිලදී ගෙන ඇත. ඒ සඳහා පහත පිරිවැයක් දරා ඇත.

| | |
|---|---|
| මෝටර් රථයේ පිරිවැය | රු. 680 000 |
| ගෙවූ තීරු ගාස්තු හා ප්‍රවාහන වියදම් | රු. 20 000 |
| සුන්බුන් අගය | රු. 50 000 |
| ඵලදායි ජීව කාලය | වර්ෂ 10 |

2015 වර්ෂය සඳහා වාර්ෂික ක්ෂය ප්‍රමාණය වන්නේ,

(1) රු. 68 000කි. (2) රු. 60 000 කි. (3) රු. 63 000කි. (4) රු. 61 000කි.

33. ව්‍යාපාරයක් සිය සියළුම ජංගම නොවන වත්කම එක පැකේජයක් ලෙස රක්ෂණය කර ඇත. මාසික රක්ෂණ වාරිකය රු. 3 500 කි. මුදලින් ගෙවා ඇති රක්ෂණ වාරිකවල වටිනාකම රු. 39 000 කි. වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයට හඳුනාගත යුතු රක්ෂණ වියදම කොපමණ ද?

(1) රු. 3 500 කි. (2) රු. 39 000 කි. (3) රු. 42 000කි. (4) රු. 45 000 කි.

34. ප්‍රාථමික පිරිවැයේ මූලිකාංග නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

(1) ප්‍රාථමික පිරිවැය = ඍජු ද්‍රව්‍ය + වක්‍ර ශ්‍රමය + ඍජු වෙනත්

(2) ප්‍රාථමික පිරිවැය = ඍජු ද්‍රව්‍ය + ඍජු ශ්‍රමය + ඍජු වෙනත්

(3) ප්‍රාථමික පිරිවැය = වක්‍ර ද්‍රව්‍ය + වක්‍ර ශ්‍රමය + වක්‍ර වෙනත්

(4) ප්‍රාථමික පිරිවැය = වක්‍ර ද්‍රව්‍ය + ඍජු ද්‍රව්‍ය + වක්‍ර වෙනත්

35. පොත් මුද්‍රණ ආයතනයක පොත් මුද්‍රණ යන්ත්‍රයට යොදන ලිහිසි තෙල් සඳහා දරූ වියදම රු. 2 000 ක මුදල

(1) ඍජු ද්‍රව්‍ය පිරිවැයකි (2) ඍජු වෙනත් පිරිවැයකි

(3) වක්‍ර ද්‍රව්‍ය පිරිවැයකි (4) වක්‍ර වෙනත් පිරිවැයකි

- සපුමල්ගේ ව්‍යාපාරයේ 2015 12 31 දිනට දී ඇති පහත තොරතුරු ඇසුරින් 36 40 දක්වා ප්‍රශ්න වල පිළිතුරු සපයන්න.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| විකුණුම් | | 120 000 |
| ගැනුම් | 70 000 | |
| ගෙන ඒමේ කුලී | 4 000 | |
| රක්ෂණ වියදම් | 15 000 | |
| සේවක වේතන | 5 000 | |
| බෙදාහැරීමේ වියදම් | 14 000 | |
| මූල්‍ය වියදම් | 3 000 | |
| ප්‍රාග්ධනය | | 291 000 |
| ගොඩනැගිලි පිරිවැය | 200 000 | |
| 10 % ආයෝජන | 100 000 | |
| | 411 000 | 411 000 |

අතිරේක තොරතුරු

2015 12 31 දිනට තොගය රු. 25 000 කි.

අයිතිකරු රු. 5 000 ක භාණ්ඩ නිවසට ගෙන ගොස් ඇති අතර ගොඩනැගිලි 5% බැගින් ක්ෂය කරයි.

36. මෙම ව්‍යාපාරයේ 2015 12 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය හා දළ ලාභය වනුයේ,

(1) 75 000 ක් හා 40 000 කි. (2) 44 000 ක් හා 76 000 කි.

(3) 39 000 ක් හා 81 000 කි. (4) 25 000 ක් හා 75 000 කි.

37. මෙම ව්‍යාපාරයේ 2015 වර්ෂය සඳහා පරිපාලන වියදම් වල එකතුව වනුයේ,

(1) 50 000 කි. (2) 60 000කි. (3) 20 000 කි. (4) 30 000 කි.

38. 2015 12 31 දිනෙන් අවසන් වර්ෂයට ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වනුයේ,

(1) 29 000 කි. (2) 43 000කි. (3) 44 000කි. (4) 54 000කි.

39. ලැබිය යුතු ආයෝජන පොලිය

(1) ආදායමකි (2) වියදමකි (3) වත්කමකි (4) වගකීමකි

40. ගොඩනැගිලි ක්ෂය 10% දක්වා වැඩි කලහොත්,

(1) ව්‍යාපාරයේ ශුද්ධ ලාභයට බලපෑමක් නැත (2) ශුද්ධ ලාභය රු. 10 000කින් වැඩිවේ.

(3) ශුද්ධ ලාභය රු. 10 000 කින් අඩුවේ. (4) ලාභය 5% කින් වැඩිවේ.

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව **I** කොටසින් ප්‍රශ්න දෙකක්ද, **II** කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01. අමල් සහ කමල් ආහාර තාක්ෂණය පිළිබඳව ඩිප්ලෝමාධාරීන් ය. ඔවුන් දෙදෙනා එක්ව 2016 08 01 දින බෝ නොවන රෝග (දියවැඩියාව, අධි රුධිර පීඩනය, කොලෙස්ටරෝල්) වලින් පෙළෙන අය සඳහා සුදුසු ආහාර වර්ග සහ ඔසු පැන් අලෙවි කිරීම සඳහා "නිරෝගා" නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ආහාර හා පාන වර්ග නිෂ්පාදනය කිරීමේ කාර්යය අමල්ට පැවරුණු අතර ඒවා බෙදා හැරීම සම්බන්ධ කටයුතු කමල්ට පැවරුණි.

මේ සඳහා 2016 08 01 දින අමල් රු. 500 000 ක් ද කමල් රු. 840 000 ක් වටිනා ලොරි රථය ද යොදවනු ලැබීය. එදින ම ස්වයං රැකියා සඳහා දෙන ණය යටතේ 8% වාර්ෂික පොළියට රු. 240 000 ක ණයක් ලබා ගන්නා ලදී. 2016 08 31 න් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දක්වේ.

2016 08 03 ආහාර පිසීමේ උපකරණ රු. 200 000 කට මිල දී ගැනීම

2016 08 05 අමුද්‍රව්‍ය මිලට ගැනුම් රු. 25 000 කි.

2016 08 06 අමුද්‍රව්‍ය ණයට ගැනුම් රු. 10 000කි.

2016 08 07 ප්‍රචාරණය සඳහා අත් පත්‍රිකා සහ පෝස්ටර් මුද්‍රණයට රු. 5 000 කි.

2016 08 10 ගෑස් හා විදුලිය සඳහා ගෙවීම රු. 2 500 කි.

2016 08 15 විකුණුම් ආදායම රු. 15 000 කි.

2016 08 25 ඉන්ධන වියදම් රු. 3 000 කි.

2016 08 30 ණයට විකුණුම් ආදායම රු. 25 000 කි.

ආහාර ද්‍රව්‍ය ලොරි රථයෙන් නගරයේ පිහිටි රාජ්‍ය ආයතන අසලට ගෙන ගොස් විකුණනු ලැබේ. ලොරි රථය වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලැබේ. ආහාර ද්‍රව්‍ය හා ඔසු පැන් සමග බෝ නොවන රෝග වළක්වා ගත හැකි ආකාරය පිළිබඳ උපදෙස් පත්‍රිකාවක් සමග විසිතුරු ඇසුරුමක් ද සපයනු ලබයි.

(i) (අ) "නිරෝගා" ව්‍යාපාර ආයතනය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ දැකිය හැකි වාසියක් හා අවාසියක් දක්වන්න.

(ii) (අ) එම ව්‍යාපාරය සතු ශක්තියක් සඳහන් කරන්න.

(ආ) "නිරෝගා" ව්‍යාපාරයේ ප්‍රවර්ධන කටයුතු සඳහා යොදාගන්නා එක් උපක්‍රමයක් සඳහන් කරන්න.

(iii) (අ) මෙම ව්‍යාපාරයේ පහත කරුණු සම්බන්ධ නීතිමය තත්ත්වයන් පැහැදිලි කෙරෙන පනත් / ආඥා පනත් පහත වගුවේ දක්වන්න.

| ලක්ෂණය | පණත / ආඥා පනත |
|---|---|
| සාමාජික සංඛ්‍යාව | |
| ලිඛිත ගිවිසුම | |

(iv) (අ) ● නිෂ්පාදන කටයුතු අමල්ට පැවරීම ● බෙදා හැරීම් කටයුතු කමල්ට පැවරීම

ඉහත කාර්යයන් කුමන කළමනාකරන කාර්යයට අයත් ද?

(ආ) ඉහත සිද්ධියේ ඉලක්ක වෙළඳ පොළක් නම් කරන්න.

(v) 2016 08 01 දිනට මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව දක්වන්න.

(vi) 2016 08 30 දින සිදු වූ ගණුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත සඳහන් කරන්න.

(vii) මෙම ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කර තුලනය කරන්න.

(viii) (අ) 2016 අගෝස්තු මාසයට අදාළ ලොරි රථයේ ක්ෂය ප්‍රමාණය කොපමණ ද?

(ආ) එම මාසයට අදාල ක්ෂය ගිණුම් ගත කිරීමේ ජ'නල් සටහන ලියා දක්වන්න.

(ix) මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වගකීමක් හා ජංගම වගකීමක් සඳහන් කරන්න. (2 × 10= 20)

(x) 2016 අගෝස්තු 31 දිනට ශුද්ධ ලාභය ගණනය කරන්න.

## II පත්‍රය - I කොටස

● **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

02. (i) (අ) වුවමනාවක් යනු කුමක් ද? (ල. 01)

(ආ) වුවමනාවක ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 01)

(ii) රජය ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයකි.

(අ) රජය ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුවක් ලියන්න. (ල. 01)

(ආ) ව්‍යාපාර රජයෙන් අපේක්ෂා කරන දායකත්වයක් නම් කරන්න. (ල. 01)

(iii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද දක්වන්න.

(අ) භාණ්ඩ පමණක් නිෂ්පාදනයට යොදා ගන්නා සම්පත් නිෂ්පාදන සාධක නම් වේ.

(ආ) විද්‍යුත් මාධ්‍යයෙන් ලෝකයේ ඕනෑම රටක සිට ගනුදෙනු කළ නොහැකිය.

(ඉ) පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂිත කිරීම නෛතික පරිසරයට අදාළ වේ.

(ඊ) බාබර් සාප්පුව භාණ්ඩ සපයන ව්‍යාපාරයකි. (ල. 02)

(iv) ධාන්‍ය වර්ග ආශ්‍රිතව පිටි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය සපුමලී නවීන තාක්ෂණයෙන් යුත් පිටි නිෂ්පාදන යන්ත්‍රයක් මිල දී ගත්ත ද එය ක්‍රියාකිරීමට ඇයට දැනුමක් නොතිබූ අතර පළපුරුදු සේවකයකු සොයා ගැනීමට ද නොහැකි විය.

සපුමලීගේ ව්‍යාපාරයේ

(අ) දුර්වලතාවයක්

(ආ) තර්ජනයක් ලියන්න. (ල. 02)

(ල. 08)

03. (i) චන්ද්‍රසිරි තම ව්‍යාපාර කටයුතු වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් රුපියල් ලක්ෂ 15 ට ලොරි රථයක් මිළට ගත් අතර ඒ සඳහා තම අත තිබූ මුදලින් රුපියල් ලක්ෂ 5 ක් ද ඉතිරිය ලංකා බැංකුවෙන් ණය මුදලක් ලබාගන්නා ලදී. ඔහුගේ ගනුදෙනු පහසු කර ගැනීම සඳහා ජංගම ගිණුමක් ද ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මෙම ලොරි රථය රක්ෂණය කරන ලදී.

(අ) මෙම සිද්ධියේ සඳහන් උපකාරක සේවා 02 ක් නම් කරන්න. (ල. 01)

(ආ) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ඇතිවිය හැකි වාසි 02 ක් ලියන්න. (ල. 01)

(ඇ) චන්ද්‍රසිරි ගේ ව්‍යාපාරය කිනම් ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද? (ල. 01)

(ඈ) මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාමේ අවාසි 02 ක් ලියන්න. (ල. 01)

(ඉ) ලොරි රථයෙන් භාණ්ඩ ප්‍රවාහනයේ දී අතරමගදී ඇතිවිය හැකි අනතුරු වලින් සිදුවන අලාභ ආවරණය කර ගැනීම සඳහා ලබාගත හැකි රක්ෂණ ඔප්පුවක් නම් කරන්න. (ල. 01)

(ඊ) ලොරි රථයෙන් භාණ්ඩ ප්‍රවාහනයේ දී ඇති විය හැකි අවාසි 02 ක් ලියන්න. (ල. 01)

(ii) පහත ප්‍රකාශ ද සත්‍ය ද අසත්‍ය ද දක්වන්න.

(අ) රක්‍ෂණ ආවරණය ලබාගන්නා පාර්ශවය රක්‍ෂකයා වේ.

(ආ) කන්කසන්තුරේ සිට කොළඹට භාණ්ඩ ප්‍රවාහනයට සුදුසු ම මාර්ගය මුහුදු මාර්ගයයි.

(ඉ) ස්ථාවර තැන්පතු සඳහා බැංකු අයිරා පහසුකම් ලබාගත හැක.

(ඊ) ස්කයිප් තාක්‍ෂණය විද්‍යුත් මාධ්‍යයක් ලෙස පමණක් වර්ග කළ හැකිය. (ල. 02)

(ල. 08)

04. (i) (අ) සිල්ලර වෙළඳාම යනු කුමක් ද? (ල. 01)

(ආ) සිල්ලර වෙළඳාමේ හා තොග වෙළඳාමේ දැකිය හැකි වෙනස්කමක් ලියන්න. (ල. 01)

(ii) ගැමුණු මධ්‍ය මහා විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය 2016 පළමු වාරයේ සාර්ථකව පවත්වන ලදී. එහි දී අනුගමනය කළ ක්‍රියාවලියේ පියවර කිහිපයක් පහත දැක්වේ. එම කටයුතු කළමනාකරණ කාර්යයන් යටතේ වර්ග කරන්න.

(අ) නිවාස සඳහා නිවාස නායකයන් පත් කිරීම

(ආ) ක්‍රීඩා උත්සවයට පවත්වන තරඟ පිලිබඳ තීරණය කිරීම

(ඉ) නිවාස වල කටයුතු නිසි අයුරින් සිදුවන්නේ දැයි සොයා බැලීම.

(ඊ) නිවාස නායකයන් විසින් තම නිවාසයේ තරඟ කරුවන්ට අවශ්‍ය උපදෙස් සැපයීම. (ල. 02)

(iii) (අ) සාමාන්‍ය කොටස් වල ආයෝජනයේ ප්‍රතිලාභ 02ක් ලියන්න. (ල. 01)

(ආ) පූර්ණ රාජ්‍ය ආරක්‍ෂාවක් ඇති ආයෝජන මාර්ගය කුමක් ද? (ල. 01)

(iv) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක ඉලක්ක අපේක්ෂිත පරිදි ඉටු කර ගැනීම කාර්යක්‍ෂමතාවයයි.

(ආ) ආයතනයක කළමනාකරුවන් විසින් තම සේවකයන්ට අවශ්‍ය තොරතුරු සහ උපදෙස් සැපයීම මෙහෙයවීමයි.

(ඉ) සීමාසහිත සමාගමක කොටස් කරුවන්ගේ වගකීම ඔවුන් සමාගමේ ආයෝජනය කළ ප්‍රාග්ධනයට පමණක් සීමාවේ.

(ඊ) වෙළෙඳපොළ, අන්තර්ජාලය හරහා සම්බන්ධවන වෙළෙඳපොළ අවකාශයක් ලෙස ද පැවතිය හැකිය. (ල. 02)

(ල. 08)

## II කොටස

05. (i) (අ) ගිණුම්කරණයේ දී තොරතුරු සැපයීමට අමතරව සපුරාලන වෙනස් අරමුණු 02 ක් සඳහන් කරන්න. (ල. 01)

(ආ) වත්කම්වල දැකිය හැකි ලක්‍ෂණ 02 ක් දක්වන්න. (ල. 01)

(ii) පහත ගනුදෙනු තුලින් ගිණුම්කරණ සමීකරණයට ඇති කරන බැලපෑම් පහත ආකෘතියේ දක්වන්න. (වැඩි වේ නම් (+) ලෙසත් අඩු වේ නම් () ලෙසත් දැක්විය යුතුය.)

1. රු. 500 000 ක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කිරීම.
2. රු. 200 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
3. රු. 20 000 ක භාණ්ඩ රු. 25 000 කට අත්පිට විකිණීම.
4. රු. 4 000 ක දුරකථන බිල ගෙවීම.
5. රු. 3 000 ක් අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

| ගනුදෙනු අංකය | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

(iii) පහත දක්වෙන්නේ ව්‍යාපාරයක පසුගිය මාසයේ මුදල් පොතයි එහිදී සිදු වී ඇති ගනුදෙනු මොනවාදැයි සඳහන් කරන්න. (07/02 දින සිට දින පිළිවෙලට සඳහන් කරන්න.)

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 07/01 | ශේෂය ඉ/ගෙ | | 50 000 | 07/03 | වැටුප් | | 12 000 |
| 07/02 | විකුණුම් | | 40 000 | 07/05 | ගැනුම් | | 20 000 |
| 07/10 | බැංකු ණය | | 25 000 | 07/18 | ලී බඩු | | 15 000 |
| 07/28 | ණයගැති රුවන් | | 10 000 | 07/20 | ගැනිලි | | 3 000 |
| | | | | 07/25 | බැංකු ණය | | 5 000 |
| | | | | 07/30 | ශේෂය ප/ගෙ | | 70 000 |
| | | | 125 000 | | | | 125 000 |

(ල. 04)

(iv) පහත ගනුදෙනු ඇසුරෙන් සුළු මුදල් පොතක් පිළියෙල කරන්න.

- 2016 08 01 දිනට අත ඉතිරි සුළු මුදල් ශේෂය රු. 150 කි.

| දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| 2016 / 08 / 01 | අග්‍රිමය ලැබීම | 2 850 |
| 2016 / 08 / 02 | ලිපි ද්‍රව්‍ය වියදම් | 250 |
| 2016 / 08 / 04 | ගමන් ගාස්තු | 150 |
| 2016 / 08 / 05 | තැපැල් ගාස්තු | 90 |
| 2016 / 08 / 06 | ගෙන ඒමේ කුලිය | 300 |
| 2016 / 08 / 08 | ලිපි ද්‍රව්‍ය | 100 |
| 2016 / 08 / 12 | සංග්‍රහ වියදම් | 170 |
| 2016 / 08 / 14 | ලිපි ද්‍රව්‍ය වියදම | 160 |
| 2016 / 08 / 15 | තැපැල් ගාස්තු | 80 |
| 2016 / 08 / 18 | සංග්‍රහ වියදම් | 120 |
| 2016 / 08 / 20 | ත්‍රී රෝද රථ ගාස්තුව | 110 |
| 2016 / 08 / 25 | ලියාපදිංචි තැපැල් ගාස්තුව | 180 |
| 2016 / 08 / 30 | අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා | |

(ල. 04)
(ල. 12)

06. (i) පහත තොරතුරු රවිඳුගේ ව්‍යාපාරයේ 2016 අගෝස්තු මාසයට අදාල වේ.

| දිනය | ඉන්වොයිසි අංකය | ගනුදෙනු කරු | ගනුදෙනුවේ ශුද්ධ වටිනාකම |
|---|---|---|---|
| 08 / 05 | 131 | සුනිමල් | 18 550 |
| 08 / 10 | 148 | ගයන්ත | 7 900 |
| 08 / 12 | 129 | හෂානි | 6 520 |

අවශ්‍ය වන්නේ,

(1) ඉහත ගනුදෙනු විකුණුම් ජ'නලයකට ඇතුලත් කරන්න.

(2) අදාල ලෙජර් ගිනුම් පිළියෙල කිරීම. (ල. 04)

(ii) ලී බඩු නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපාරයකට අදාලව පසුගිය මාසයේ පහත පිරිවැය තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| ලී සඳහා | රු. 30 000 |
| වඩු කාර්මික වැටුප | රු. 25 000 |
| වැලි කඩදාසි වියදම් | රු. 1 000 |
| විදුලි බිල්පත | රු. 2 000 |
| ප්‍රවාහන වියදම් | රු. 2 000 |

එම මාසයේ අල්මාරි 10 ක් පමණක් නිපදවා ඇත.

අවශ්‍ය වන්නේ,

අල්මාරියක නිෂ්පාදන පිරිවැය සොයන්න. (ල. 03)

(iii) සහන්ගේ ව්‍යාපාරයේ ආධුනික ගිණුම් ලිපිකරුවා විසින් 2016 / 08 / 31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවිය. එහි හර පැත්තට වඩා බැර පැත්ත රු. 8 100 ක් වැඩි වී ඇත. වෙනස අවිනිශ්චිත ගිණුමකට ඇතුලත් කර ඇත.

පසුව කල ගිණුම් පිරික්සීමේ දී පහත දෝෂ හඳුනාගෙන ඇත.

1. රු. 9 000 ක වැටුප් ගෙවීම මුදල් පොතේ නිවැරදිව දක්වා වැටුප් ගිණුමේ රු. 900 ලෙස දැක්විම.
2. රු. 5 000 ක ගැණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත්වලින් මග හැරී ඇත.
3. රු. 400 ක විදුලි ගාස්තු ගෙවීම විවිධ ගාස්තු ගිණුම ඇතුළත්ව ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් ලියා දක්වන්න.

(ආ) අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න. (ල. 05)

(ල. 12)

07. (i) දිල්හාන්ගේ ව්‍යාපාරයේ 2015 / 12 / 31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්ෂුම පහත දැක්වේ.

| | හර | බැර |
|---|---|---|
| 2015 / 01 / 01 ට තොගය | 40 000 | |
| ඉඩම් හා ගොඩනැගිලි | 500 000 | |
| ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම් (15/01/01) | | 40 000 |
| මෝටර් රථ | 300 000 | |
| මෝටර් රථ ක්ෂය වෙන්කිරීම් (15/01/01) | | 60 000 |
| විකුණුම් | | 350 000 |
| ගැනුම් | 180 000 | |
| ගෙන ඒමේ කුලී | 5 000 | |
| 10% බැංකු ණය | | 150 000 |
| ගෙවූ ණය පොලී | 10 000 | |
| ගමන් වියදම් | 15 000 | |
| විකුණුම් වියදම් | 20 000 | |
| ගොඩනැගිලි අලුත්වැඩියා වියදම | 4 000 | |
| ප්‍රාග්ධනය | | 730 000 |
| බොල්ණය | 1 500 | |
| ණය ගැතියෝ | 30 500 | |
| ණය හිමියෝ | | 40 000 |
| වේතන | 12 000 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 7 000 | 2 000 |
| ප්‍රචාරණ වියදම් | 15 000 | |
| රක්ෂණ ගාස්තු | 8 000 | |
| දුකරථන වියදම් | 14 000 | |
| මුදල් | 70 000 | |
| බැංකු ශේෂය | 40 000 | |
| 15% ස්ථාවර තැන්පතු(අවු.5) | 100 000 | |
| | 1372 000 | 1372 000 |

පහත අතිරේක තොරතුරු සපයා ඇත.

(1) 2015 / 12 / 31 දිනට තොගය 60 000 කි. (2) වේතන රු. 3 000 ක් හා දුරකථන වියම් රු. 1 000 ක් උපචිතය, ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු රු. 2 000 කි.

(3) ගොඩනැගිලි වල පිරිවැය 400 000 ක් වන අතර ස්ථාවර වත්කම් 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය. (4) බොල්ණය ලෙස තවදුරටත් රු. 1 500 ක් කපා හල යුතුය.

**අවශ්‍ය වන්නේ,**

(අ) 2015 / 12 / 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය (ල.05)

(ආ) 2015 / 12 / 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ල. 05)

(ii) දිල්කි ක්‍රීඩා සමාජයට අදාලව 2014 වර්සයට අදාලව පහත දී ඇති තොරතුරු ඇසුරින් ආදායම් වියදම් ගිණුම පිළියෙල කරන්න.

| | |
|---|---|
| ලියා පදිංචි සාමාජික සංඛ්‍යාව | 120 කි. |
| වාර්ෂික සාමාජික එකතුව රු. | 100 කි. |
| වර්ෂය තුළ ලැබුණා සාමාජික මුදල | 10 500 |
| 2024 / 01 / 02 දිනට ලැබිය යුතු සා. මු. | 1 200 |
| උපකරණ මිලදී ගැනීම් | 5 000 |
| පරිත්‍යාග කිරීම් | 1 200 |
| පුවත්පත් විකිණීම | 800 |
| පුවත්පත් මිලදී ගැනීම | 2 400 |
| ලැබුණු පරිත්‍යාගය | 8 000 |

(ල. 02)

(ල. 12)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 4 ) | 02. ( 3 ) | 03. ( 2 ) | 04. ( 1 ) | 05. ( 2 ) | 06. ( 4 ) | 07. ( 3 ) | 08. ( 2 ) | 09. ( 4 ) | 10. ( 3 ) |
| 11. ( 1 ) | 12. ( 2 ) | 13. ( 3 ) | 14. ( 2 ) | 15. ( 3 ) | 16. ( 4 ) | 17. ( 2 ) | 18. ( 2 ) | 19. ( 2 ) | 20. ( 3 ) |
| 21. ( 4 ) | 22. ( 1 ) | 23. ( 2 ) | 24. ( 3 ) | 25. ( 2 ) | 26. ( 3 ) | 27. ( 3 ) | 28. ( 2 ) | 29. ( 1 ) | 30. ( 4 ) |
| 31. ( 3 ) | 32. ( 2 ) | 33. ( 3 ) | 34. ( 3 ) | 35. ( 3 ) | 36. ( 3 ) | 37. ( 4 ) | 38. ( 3 ) | 39. ( 3 ) | 40. ( 3 ) |

## II පත්‍රය

01. (i) ප්‍රශ්නය

(i) (අ) හවුල්ව්‍යාපාර යනු (ල. 01)

(ආ) ඕනෑම වාසියකට හා අවාසියකට (ල. 01)

(ii) (අ) ව්‍යාපාර ක්ෂේත්‍රය පිළිබඳ දැනුම
හොඳ සැලැස්මක් තිබීම (ල. 01)
මූල්‍ය ශක්තිය

(ආ) බෝ නොවන රෝග වළක්වා ගත හැකි ආකාර පිළිබඳ උපදෙස් පත්‍රිකා ලබාදීම. (ල.01)

(iii) 1. 2007 අංක 07 දරණ සමාගම් පනත
2. වංචා වැලැක්වීමේ අඥාපනත

(iv) සංවිධානය කිරීම. (ල. 01)

(ආ) බෝ නොවන රෝග වලින් පෙළෙන අය (ල.01)

(v) වත්කම් = වගකීම් + ප්‍රාග්ධනයයි.
1580 000 = 240 000 + 1340 000 (ල. 02)

(vi) විකුණුම් ඉන්වොයිසිය විකුණුම් ජ'නලය (ල. 02)

(vii) මුදල් පොත

| දිනය | විස්තරය | | මුදල | දිනය | විස්තරය | මුදල | |
|---|---|---|---|---|---|---|---|
| 08/01 | ප්‍රාග්ධනය | ½ { | 500 000 | 08/03 | උපකරණ | 200 000 | } ½ |
| 08/01 | බැංකු ණය | | 240 000 | 08/05 | ගැනුම් | 25 000 | |
| 08/15 | විකුණුම් | | 75 000 | 08/07 | ප්‍රචාරණ | 5 000 | } ½ |
| | | | | 08/10 | විදුලිය | 2 500 | |
| | | | | 08/25 | ඉන්ධන | 3 000 | |
| | | | | 08/31 | ප/ගේ | 579 500 | ½ |
| | | | 815 000 | | | 815 000 | |

(viii) (අ) 840 000 × 10%

$$= \frac{84\ 000}{12}$$

= 7 000 (ල. 01)

(ආ) ලොරි රථ ක්ෂය ගිණුම හර 7 000
ලොරි රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම බැර 7 000 (ල. 01)

(ix) බැංකු ණය = (ල. 01)
ණය හිමියෝ = (ල. 01)

(x) විකුණුම් 75 000
25 000 100 000
() විකුණුම් පිරිවැය25 000
10 000 (35 000)
දළ ලාභය 65 000 (ල. 01)

| () වියදම් | | |
|---|---|---|
| ක්ෂය | 7 000 | |
| ප්‍රචාරණ | 5 000 | |
| විදුලිය | 2 500 | |
| ඉන්ධන | 3 000 | 17 500 |
| | | 47 500 |

(ල. 01)

**II පත්‍රය - I කොටස**

**ව්‍යාපාර අධ්‍යයනය**

02. (i) (අ) මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාරයි (ල. 01)
(ආ) අත්‍යවශ්‍ය නොවීම / විවිධ වීම / නිර්මාණය කළ හැකි වීම / සංකීර්ණ වීම / අසීමිත වීම. (ල. 01)

(ii) (අ) ලැබිය යුතු ආදායම් බදු නිසි ලෙස ලබා ගැනීම.
රැකියා අවස්ථා උත්පාදනය.
ජාතික නිෂ්පාදිතය වර්ධනය කර ගැනීම. (ල. 01)
(ආ) ව්‍යාපාර සඳහා හිතකර විවිධ දිරිගැන්වීම් ලබාදීම. (ල. 01)

(iii) (අ) අසත්‍යයයි (ආ) අසත්‍යයයි (ඉ) සත්‍යයයි (ඊ) අසත්‍යයයි (ල. $\frac{1}{2} x 4 = 02$)

(iv) (අ) පුහුණු / පළපුරුදු සේවකයින් නොසිටීම
(ආ) නව තාක්ෂණ ක්‍රම සඳහා අනුගත වීමේ දුෂ්කරතා (ල. 01 × 02 = ) (ල. 08)

03. (i) (අ) බැංකු සේවා සහ රක්ෂණ සේවා (ලකුණු $\frac{1}{2} x 2 = 01$)
(ආ) 1. චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකි වීම
2. බැංකු අයිරා පහසුකම් ලබාගත හැකි වීම
3. සෘජු ප්‍රේෂණ රැස් කිරීම
4. ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
5. බැංකු ප්‍රකාශය ලැබීම
(මේවායින් 02 ක් තිබිය යුතුයි) (ල. $\frac{1}{2} x 2 = 01$)
(ඇ) තනිපුද්ගල ව්‍යාපාරයක් (ල. 01)
(ඈ) අයිතිකරුගේ වගකීම් අසීමිත වීම
ප්‍රාග්ධනය රැස්කිරීමේ දුෂ්කරතා පැවතීම
අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම
අලාභ තනිව දරා ගැනීමට සිදුවීම
තනිව ගන්නා තීරණ අසාර්ථක විය හැකි ය. (ල. $\frac{1}{2} x 2 = 01$)
(ඉ) රථවාහන රක්ෂණ ඔප්පුව / මාර්ගස්ථ බඩුතොග රක්ෂණ ඔප්පුව (ල. 01)
(ඊ) මාර්ග තද බදය ඇතිවීම / ප්‍රමාදවීම / පිරිවැය වැඩිවීම
මාර්ග අනතුරු සාපේක්ෂ වශයෙන් වැඩිවීම
අදාළ පිළිතුරු බලා ලකුණු දෙන්න. (ල. $\frac{1}{2} x 2 = 01$)

(ii) (අ) අසත්‍යයයි (ආ) සත්‍යයයි (ඉ) අසත්‍යයය (ඊ) අසත්‍යයයි (ල. $\frac{1}{2} x 04 = 02$) (ල. 08)

04. (i) (අ) අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීමයි. (ල. 01)
(ආ) පෙළපොතේ සඳහන් තොරතුරු තිබේ නම් ලකුණු දෙන්න. (ල. 01)

(ii) (අ) සංවිධානකරණයයි (ආ) සැළසුම්කරණයයි (ඉ) පාලනයයි
(ඊ) මෙහෙයවීමයි (ල. $\frac{1}{2} x 4 = 02$)

(iii) (අ) ලාභාංශ ලැබීම, ප්‍රාග්ධන ලාභ උපයාගත හැකි වීම, ඡන්ද බලය හිමි වීම, සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම, කොටස් අලෙවි කර මුදල් බවට පත් කළ හැකි වීම, අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට හැකියාව, සමාගමට සම්බන්ධ තීරණ ගැනීමේ හැකියාව (මින් 02 ක් සඳහා) (ල. $\frac{1}{2} x 2 = 01$)
(ආ) භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීම. (ල. 01)

(iv) (අ) අසත්‍යයයි (ආ) සත්‍යයයි (ඉ) සත්‍යයයි (ඊ) සත්‍යයයි (ල. $\frac{1}{2} x 4 = 02$) (ල. 08)

**II කොටස**

05. (i) (අ) ඕනෑම අරමුණු 02 කට (ල. 01)
(ආ) ලක්ෂණ 02 කට (ල. 01)

(ii)

| | වත්කම් | හිමිකම් | වගකීම් |
|---|---|---|---|
| (1) | + 500 000 | + 500 000 | |
| (2) | + 200 000 | | + 200 000 |
| (3) | + 25 000 | | |
| | (20 000) | + 5 000 | |
| (4) | (4 000) | (4 000) | |
| (5) | (3 000) | (3 000) | (ල. 02) |

(iii) ගනුදෙනු හඳුනාගෙන ලකුණු ලබා දෙන්න.

(iv) ආරම්භක ශේෂය දැක්වීමට (ල. 01)
අවසාන අග්‍රිමය ප්‍රතිපූර්ණයට 1710 (ල. 01)
වියදම් විශ්ලේෂණ සඳහා (ල. 02)

06. (i)

විකුණුම් ජ'නලය

| දිනය | ගනුදෙනු කරු | වටිනාකම |
|---|---|---|
| 08 / 05 | සුනිමල් | 18 550 |
| 08 / 10 | ගයන්ත | 7 900 |
| 08 / 12 | හෂානි | 6 520 |
| | විකුණුම් ගිණුමට බැර කළා | 32 970 |

(ල. 02)

විකුණුම් ගිණුම

| | |
|---|---|
| | ණයගැතියෝ 32 970 |

සුනිමල්

| | |
|---|---|
| විකුණුම් 18 550 | |

හෂානි

| | |
|---|---|
| විකුණුම් 6 520 | |

ගයන්ත

| | |
|---|---|
| විකුණුම් 7 900 | |

(ල. ½ x 4 = 02)

(ii)

30 000
25 000
1 000
2 000
2 000

මුළු පිරිවැය 60 000 / 10

= 6 000 (ල. 03)

(iii)

(ල. 01) අවිනිශ්චිත ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| ඉ/ගෙ | 8 100 | වැටුප් | 8 100 | (ල. 01) |
| | 8 100 | | 8 100 | |

01. වැටුප් ගිණුම හර 8 100
අවිනිශ්චිත ගිණුම බැර 8 100 (ල. 01)

02. ගැනුම් ගිණුම හර 5 000
ණය හිමි ගිණුම බැර 5 000 (ල. 01)

03. විදුලි ගාස්තු ගිණුම හර 400
විවිධ වියදම් ගිණුම බැර 400 (ල. 01)

The National e-learning Portal for The General Education

07. (අ) දිල්ෂාන්ගේ ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 350 000 |
| () විකුණුම් පිරිවැය | | | |
| ආරම්භක තොගය | | 40 000 | |
| ගැනුම් | | 180 000 | |
| ගෙන ඒමේ කුලී | | 5 000 | |
| | | 225 000 | |
| () අවසන් තොගය | | ½ (60 000) | |
| විකුණුම් පිරිවැය | | | ½ (165 000) |
| දළ ලාභය | | | 185 000 |
| (+) වෙනත් ආදායම් | | | |
| ලද වට්ටම් | | 2 000 | |
| ස්ථාවර තැන්පතු පොලී | | ½ 10 000 | 12 000 |
| | | | 197 000 |
| () වියදම් | | | |
| බොල්ණය | වියදම් වර්ග කර තිබිය යුතුයි. | 3 000 | ½ |
| වේතන | | ½ 15 000 | |
| දුරකථන | | 15 000 | ½ |
| රක්ෂණ | | ½ 6 000 | |
| ගොඩනැගිලි ක්ෂය | | 40 000 | ½ |
| මෝටර් රථ ක්ෂය | | ½ 30 000 | |
| බැංකු ණය පොලී | | 15 000 | ½ |
| ගමන් වියදම් | | 15 000 | |
| ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | | 4 000 | |
| දුන් වට්ටම් | | 7 000 | |
| ප්‍රචාරණ | | 15 000 | |
| විකුණුම් වියදම් | | 20 000 | 185 000 |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධනය බැර කළා | | | 12 000 |

මූල්‍ය තත්ව ප්‍රකාශය

| | පිරිවැය | ස. ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 500 000 | (80 000) ½ | 420 000 |
| මෝටර් රථ | 300 000 | (90 000) ½ | 210 000 ½ |
| | | | 630 000 |
| 15% ස්ථාවර තැන්පතු | | | 100 000 |
| ජංගම වත්කම් | | | |
| තොගය | | 60 000 | |
| ණයගැතියො | | ½ 29 000 | |
| ඉ. ගෙවූ රක්ෂණය | | 2 000 ½ | |
| මුදල් | | 70 000 | |
| බැංකු | | 40 000 | |
| ලැබිය යුතු පොලී | | ½ 10 000 | 211 000 |
| මුළු වත්කම් | | | 941 000 |
| ප්‍රාග්ධනය | | | 730 000 |
| (+) ශුද්ධ ලාභය | | | ½ 12 000 |
| | | | 742 000 |
| ජංගම නොවන වගකීම් | | | |
| 10% බැංකු ණය | 150 000 | 150 000 | |
| ජංගම වගකීම් | | | |
| උපචිත වේතන | ½ 3 000 | | |
| උ. දුරකථන | ½ 1 000 | | |
| උ. ණය පොලී | 5 000 ½ | | |
| ණය හිමියො | 40 000 | 49 000 | 199 000 |
| මුළු වගකීම් | | | 941 000 |

07. (ආ)

ආදායම් හා වියදම් ගිණුම

| | | | |
|---|---|---|---|
| පරිත්‍යාග | 1 200 } ½ | සා. මුදල් | 120 000 (ල. ½ ) |
| පුවත්පත් ගැනීම් | 1 400 | පුවත්පත් විකුණුම් | 800 } ½ |
| අතිරික්තය සමුච්චිත අරමුදලට ගෙනගියා | 126 200 ½ | ලද පරිත්‍යාග | 8 000 |
| | 128 800 | | 128 800 |

(ල. 02)

The National e-learning Portal for The General Education